කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2011

2013 දෙසැම්බර්

## BMGT E 2065 – සංවිධාන න්‍යාය හා සැකැස්ම

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

**පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

(01) පහත සිද්ධිය කියවා අවසානයේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**<u>සන්ලැක් තීන්ත සමාගම</u>**

සන්ලැක් තීන්ත නිෂ්පාදන සමාගම, පී. එල්. සුරේෂ් මහතා විසින්, 1989 දී පිළිගත් තීන්ත නිෂ්පාදන සමාගමක සේවයෙන් ඉල්ලා අස්වූ පසු 1990 වසරේදී පිහිටුවන ලදී. ඔහු වෘත්තියෙන් රසායන විද්‍යාඥයෙක් වන අතර, තීන්ත සඳහා වර්ණ හා ගුණාංග මුසුකිරීම සම්බන්ධයෙන් කාර්මික විශේෂඥයෙකි. සමාගම ආරම්භයේ සිටම, නිවාස සඳහා පිටත හා ඇතුලත සඳහා වන තීන්ත නිෂ්පාදනය කරන ලදී. කර්මාන්තය තුල ප්‍රධාන තීන්ත නිෂ්පාදනය කරන ආයතන පද්ධතියක් පැවතියද තම අඩුමිල උපාය මාර්ගය නිසා දූරස්ථ වෙළෙඳපොලවල් වල ප්‍රාමානික වෙළඳපොල කොටසක් අත්පත්කරගැනීමට සමාගමට හැකිවිය.

සමාගමේ ආරම්භයේ සිට සුරේෂ් මහතා, කළමනාකරණ අධ්‍යක්ෂක ලෙස කටයුතු කළ අතර, පසුව උපාධිධරයන් හතර දෙනෙකු සහකාර කළමනාකරුවන් ලෙස ඔහු බඳවා ගන්නා ලදී. ආරම්භයේදී, සමාගම තුළ 30 ක සේවක පිරිසක් හා අලෙවි හා නිෂ්පාදන යන අංශ දෙකක් සහිතව කටයුතු කරන ලදී.

සමාගම තම නිෂ්පාදන හා වෙළඳපොල විවිධාංගීකරණය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, සමාගම කාර්මික උපකරණ සඳහා හා ද්‍රව ආරක්ෂිත තීන්ත වර්ග නිෂ්පාදනය ඇරඹී අතර, මෑත කාලයේ සිට යකඩ භාණ්ඩ හා උපකරණ සඳහා වන තීන්ත නිෂ්පාදනය කරයි. සමාගම තම වෙළඳපොල විනිවිදයාමේ උපාය මාර්ගය හා කඩිනම් වර්ධන උපාය මාර්ගයන් මගින් ආයතන වෙළෙඳපොල තුල ප්‍රමුඛව කටයුතු කිරීමේ හැකියාව ලබාගන්නා ලදී.

සංවිධානය තම වර්ධනයත් සමගම, තම ප්‍රධාන නිෂ්පාදනයන් වන, ගෘහ ආශ්‍රිත තීන්ත, කාර්මික තීන්ත හා ද්‍රව ආලේපන සඳහා වෙන වෙනම දෙපාර්තමේන්තු පිහිටුවීමට තීරණය කරන ලදී. කෙසේවෙතත්, සෑම දෙපාර්තමේන්තුවක්ම වැඩ මුර ක්‍රමයට, සමාගමේ නිෂ්පාදන පහසුකම් පොදුවේ යොදා ගනී. තවදුරටත් සමාගමේ අලෙවි කටයුතු මධ්‍යගත අලෙවිකරණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරනු ලබයි.

පසුගිය මාස කීපය තිස්සේ, තම නිෂ්පාදන අංශ ත්‍රිත්වයේ කටයුතු සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රශ්නවලට මුහුණ දෙමින් සිටියි. අංශ ප්‍රධානීන් විසින් නිතරසිදුවන නිෂ්පාදන ප්‍රමාදයන් (පැහැදිලි නිෂ්පාදන වැඩ සටහන් නොමැතිකම, අධි හා ඌන නිෂ්පාදන ධාරිතාවයන් උපයෝජනය හා සමහර නිෂ්පාදන අංශ ප්‍රධානීන්ගේ සහයෝගී නොවන චර්යාවන්) පිළිබඳ සුරේෂ මහතාට පැමිණිලි කරයි.

සමාගමේ අලෙවිකරණ අංශයද, නිෂ්පාදන අංශයේ කටයුතු සම්බන්ධයෙන් අපහසුතාවයට පත් වී ඇත. අලෙවිකරණ අංශයට පෙනී යන්නේ, අලෙවිකරණ කටයුතුවලදී, එක් එක් අංශයේ නිෂ්පාදන සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට බලපෑම් කිරීම සිදුවන බවයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අලෙවිකරණ කළමනාකරුට තම කටයුතුවල ප්‍රශස්ත මට්ටමට බාධාකාරී වන ලෙස, නිෂ්පාදන අංශවල ගැටුම්කාරී ඉල්ලීම් ඉටු කිරීමට සිදු වී ඇත.

මෙම පසුබිම යටතේ, අලෙවිකරණ අංශයේ සම්බන්ධීකරණ ප්‍රශ්න හා නිෂ්පාදන අංශවල ගැටුම් විසඳීම පිණිස, සමාගමේ කටයුතු ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ සුරේෂ් මහතා සලකා බලමින් සිටියි. කෙසේවෙතත් ඔහුට තම කළමනාකාර අධ්‍යක්ෂ ලෙස තනතුරේ බලය හා අධිකාරිය තවදුරටත් පවත්වාගැනීමට වුවමනා නමුත් අවශ්‍ය වෙනස්කම් කිරීමට ඔහු සූදානම්ය.

මෙය මනඃකල්පිත සිද්ධියකි.

<u>ප්‍රශ්න</u>

අ) මෙම සමාගම හා සම්බන්ධිත සංවිධාන සැකැස්ම පිළිබඳ ප්‍රධාන ගැටළු හඳුනාගන්න.

(ලකුණු 14)

ආ) මෙම සමාගම සඳහා උචිත සංවිධාන ව්‍යුහයක් දක්වමින්, මෙම සංවිධානය සඳහා යෝග්‍ය සංවිධාන සැකැස්මක් යෝජනා කරන්න.

(ලකුණු 14)

(02) අ) සංවිධාන න්‍යාය සැකැස්ම යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 08)

ආ) ඵලදායී සංවිධාන කළමනාකරණයක් සඳහා සංවිධාන න්‍යාය පිළිබඳ දැනුම අවශ්‍ය වන්නේ කෙසේද යන්න විස්තර කරන්න.

(ලකුණු 10)

(03) අ) සංවිධානයක පරිසර ඇගයීම යටතේ සලකාබැලිය යුතු ප්‍රධාන සංවිධාන වාතාවරණ ස්වරූපයන් මොනවාද?

(ලකුණු 08)

ආ) සංවිධානයක් කෙරෙහි වන සංවිධාන වාතාවරණ බලපෑම තක්සේරු කිරීම සඳහාවන ආකෘතියක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

(04) අ) සංවිධාන ව්‍යුහයක වන මූලික මානයන් (Dimensions) මොනවාද?

(ලකුණු 08)

ආ) යෝග්‍ය උදාහරණ දක්වමින් එක් එක් සංවිධාන ව්‍යුහමය මානයන් සංවිධාන ව්‍යුහය තීරණය කිරීමෙහිලා බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(05) අ) සංවිධානයකට අනුගමනය කළ හැකි මූලික උපායයන් කවරේද?

(ලකුණු 08)

ආ) විවිධාංගීකරණ උපාය මාර්ගයක් ක්‍රියාත්මක කිරීමෙහිලා යෝග්‍ය වන සංවිධාන සැකැස්මක ස්වභාවය විස්තර කරන්න.

(ලකුණු 10)

(06) අ) සංවිධාන සැකසීමක් සඳහාවන මූලික සංවිධාන ආකෘතීන් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 08)

ආ) ව්‍යාපාර ලෝකයේ බහුලවම යොදාගන්නා සංවිධාන සැකැස්මවල් වන්නේ, යාන්ත්‍රික හා වෘත්තීය නිලතන්ත්‍රවාදයයි. සංවිධානමය ලෝකය තුල නිලතන්ත්‍රවාදය බහුලව යොදාගැනීමට හේතුවන කරුණු විස්තර කරන්න.

(ලකුණු 10)

(07) අ) සංවිධාන සැකැස්ම කෙරෙහි වන බලපෑම හුවා දක්වමින් නිෂ්පාදන හා සේවා තාක්ෂණය එකිනෙකට සංසන්දනය කරන්න.

(ලකුණු 08)

ආ) සංවිධාන සැකැස්ම කෙරෙහි සෘජු බලපෑමක් කර ඇති සංවිධාන තාක්ෂණ සංවර්ධනයක් දෙකක් හඳුනාගන්න.

(ලකුණු 10)

(08) පහත මාතෘකා අතුරින්, මාතෘකා **<u>දෙකක් (02)</u>** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ) සංවිධානමය ප්‍රවේශයන්

ආ) සංවිධාන පලදායිත්වය ඇගයීම

ඇ) සංවිධාන සංස්කෘතිය හා සංවිධාන ව්‍යුහය

ඈ) සංවිධාන ප්‍රමාණය හා එහි බලපෑම

(එකකට ලකුණු 09 බැගින්)

(මුළු ලකුණු 13 යි)